(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 89.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0286/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(iii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0756/'10

3\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ගුරු වෘත්තියේ නියැළී සිටින, අධ්‍යාපන විද්‍යාපීඨවලින් පිටවූ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් අතරින් ශාස්ත්‍රවේදී උපාධි, විද්‍යාවේදී උපාධි, පශ්චාත් උපාධි, ශාස්ත්‍රපති උපාධි ආදී උපාධි තලයන් දක්වා උසස් අධ්‍යාපනය ලබා ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ලබා ඇති එම උපාධි අනුව ගුරු සේවයේ ඒ ඒ ශ්‍රේණිවලට ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පත්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සබරගමුව පළාත් සභාවේ සේවය කරන ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන් උපාධි ලබා තිබේ නම්, ඔවුන්ගේ පත්වීම් උපාධිධාරී ගුරු පත්වීම් ලෙස සලකා ගුරු සේවයේ ආදාළ ශ්‍රේණිවල පිහිටුවීම සඳහා චක්‍ර ලේඛයක් එම පළාත් සභාව විසින් නිකුත්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) අනෙකුත් ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ලබාගත් උපාධි අනුව ගුරු සේවය තුළ උසස්වීම් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0811/'10

4\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0860/’10

5.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම්, දිස්ත්‍රික්ක සහ අධ්‍යාපන කලාප මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් ලබාදෙන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) මෙම වැඩසටහන අනුව එක් සිසුවෙකුට දිනකට වෙන්කරනු ලබන මුදල හා ලබාදෙන ආහාර වේල කවරේද;

(v) මෙම වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මකවන ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ පාසල් සඳහා ආහාර සපයන අධ්‍යාපන කලාප ගණනාවකම ආහාර සැපයුම්කරුවන්ට නියමිත පරිදි මුදල් ගෙවා නොමැති බවත්;

(ii) ආහාර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත් හා එමඟින් පාසල් සිසුන්ට ආහාර ලබාදීමේ වැඩසටහනට බාධා වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද;

(ii) මේ වනවිට ඔවුන්ට ගෙවා ඇති හිඟ මුදල ඒ ඒ දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0905/’10

6.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වසර පහකට අධික කාලයක් නැගෙනහිර පළාතේ කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවයකරමින් සිටි ඉංග්‍රීසි ගුරුවරුන් පිරිසක් සඳහා අදියර දෙකකින් (රා.ප.චක්‍රලේඛ අංක 13/2005 සහ 21/2006 යටතේ) ස්ථිර පත්වීම් පිරිනමන ලද බවත්;

(ii) ඉහත රා.ප. චක්‍රලේඛවලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ED/2/29/4/1/46 හා 2005/7/19 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පරිදි, 2005/7/28 දින සිට ඉහත ගුරු පිරිසෙන් කොටසකට පත්වීම් ලබාදී ඇති නමුත්, 2003 - 2004 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවය කරන 50 දෙනෙකු පමණ ගුරු පිරිසකට මේ දක්වා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර, අක්කරපත්තුව සහ සම්මන්තුරේ යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමටත්;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩ්ඩිරිප්පු, කල්කුඩා සහ මඩකලපු යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබාදීමටත්;

නොපමාව පියවර ගන්නේද, යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1003/’10

7.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජාතික විදුලි බල අවශ්‍යතාවය දෛනික, මාසික හා වාර්ෂික පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2005 දක්වා ජාතික විදුලිබල පද්ධතියට දායක වූ විදුලිය ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 2005 සිට මේ දක්වා ජාතික විදුලිබල පද්ධතියට අලුතින් එකතු කිරීමට හැකි වූ විදුලිබල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට ඉදිකිරීම් ආරම්භ කර ඇති ගල් අඟුරු හා ජල විදුලි බලාගාර මගින් ඉදිරියේදී උත්පාදනය කිරීමට අපේක්ෂිත විදුලි බල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

(ii) එම නව විදුලි උත්පාදනය තුළින් ජාතික විදුලි අවශ්‍යතාවය සම්පූර්ණ වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1059/’10

8.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, අක්කරායන් ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත්, ස්කන්ධපුරම් ගම්මානයේ ගොවීන්ට නියමිත කාලය තුළදී සහනාධාර යටතේ ලබා දෙන පොහොර ලබා දී නොමැති බවත්;

(ii) වී වපුරා දින 60 ක පමණ කාලයක් ගතවී තිබුණද, දින 35 – 45කින් යෙදිය යුතු දෙවන අදියරයේ පොහොර මුළුමනින්ම ලබා දී නොමැති බවත්;

(iii) එම තත්වයන් යටතේ තම වී වගාවට පොහොර යෙදීමේදී ගොවීන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නැවත පදිංචි වූ ජනතාවට තම කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීමට පහසු වන සේ සහනාධාර පදනම මත ලබා දෙන යෙදවුම් නිසි කාලය තුළ ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0287/'10

9\.

ගරු රවී කරුණානායක මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0812/'10

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0861/'10

11\.

ගරු අජිත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල - මාතර දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන වැඩකටයුතු කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදෙන රට හෝ ආයතනය කවරේද;

(iv) ලබාදෙන එම මූල්‍යා ප්‍රතිපාදනය ණයක්ද නැතහොත් ආධාරයක්ද;

(v) එය ණයක් නම්, ඊට අදාළ පොලිය, ආපසු ගෙවිය යුතු කාල සීමාව හා කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන්;

(i) අත්සන් කළ ගිවිසුම් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) නිමකිරීම සඳහා භාරදුන් කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iii) උපදේශකයින් ලෙස කටයුතු කරන්නේ කවුරුන්ද;

(iv) අධීක්ෂණය කරනු ලබන ආයතනය කවරක්ද;

(v) නිම කිරීමට අපේක්ෂිත කාලය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතියේ උප කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන්ට පැවරී ඇති උප කොන්ත්‍රාත්තුවේ ස්වභාවයන් හා එහි වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඉන්දියාවේ හෝ වෙනත් රටක කම්කරුවන් සේවයේ යෙදී සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

12.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතුරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1004/'10

13.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මග නැගුම වැඩසටහන යටතේ කොන්ක්‍රීට් කැට අල්ලා මාර්ග සංවර්ධනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි ව්‍යාපෘති සඳහා 2010 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයට වෙන් කළ මුදල කොපමණද:

(ii) ඒ යටතේ සිදු කළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් සංවර්ධනය කළ මාර්ගයන්හි දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තාවූ නීරක්තිය නැමැති මන්දපෝෂණ තත්වයෙන් පෙළෙන ළදරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) නිරක්තියෙන් පෙළෙන ළදරු පරපුර එම තත්වයෙන් මුදවා ලීටමට රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග නිරක්තියට විසඳුම් ලබාදීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1087/'11

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සාගර රළ බල ශක්තිය විදුලිබල ජනන ප්‍රභවයක් ලෙසට යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යයනයක් මේ දක්වා සිදුකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාගර රළ බලශක්තිය අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හා තරඟකාරී ලෙසට යොදා ගැනීමට ඇති හැකියාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 අප්‍රේල් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*4.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*9.

පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0181/'10

1.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අඟුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0182/'10

2\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0183/'10

3\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සූරියවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0184/’10

4.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0185/’10

5\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0186/’10

6\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?